05/06/2011 - ඉරිදා ලංකාදීප

**ප්‍රජාතන්ත්‍රවාදයේ නැවුම් බව ආරක්ෂා කරන ජන සම්මුතිය - මිලින්ද මොරගොඩ**

ප්‍රජාතන්ත්‍රවාදය යනු බහුතර මතය අනුව රටක් පාලනය කිරීමද? බහුතරය දරන මතය හැම විටම නිවැරදිද? මේ ගැන අලුත් විවාදයක් පැන නැගී ඇත. Majoritism යන්න මේ බහුතරයේ හිතුවක්කාරකම් ගැන කතා කිරීමයි. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය අනුව මහජනතාව ස්වකීය කැමැත්තෙන් මහජන නියෝජිතයෝ පත්කර ගනිති. එය මැතිවරණයයි. මැතිවරණයෙන් තේරී පත්වන මහජන නියෝජිතයන්ගෙන් සමන්විත බහුතරය ඇති දේශපාලන පක්ෂයට රටක පාලන බලය හිමිවෙයි. ප්‍රජාතන්ත්‍රවාදයේ නිර්වචනය බහුතරයගේ කැමැත්ත යන්න නොවේ. සමස්ථ සමාජය සම්මුතියකට එළැඹීමට ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය යටතේ ඉඩ ලැබේ. බහුතරයක් ලැබීම ප්‍රජාතන්ත්‍රවාදයේ ජයක් නොවේ. පවතින ක්‍රමය ගැන සමාජයේ සියලු දෙනා අතර විශ්වාසයක් ඇතිවිය යුතුය. සුළු ජාතිය මහ ජාතිය හා වෙනත් ජන කොටස් එයට එකඟ නම් එය සමාජ සම්මුතියයි. එකී සම්මුතිය බිඳ වැටුණ අවස්ථාවේ දී ක්‍රමය ගැන විරෝධතා පැන නැගෙයි. බහුතරය ඇතත් ජන සම්මුතියක් නැති තැන ප්‍රජාතන්ත්‍රවාදයක් නැත.

අද ලෝකයේ රටවල් වැඩි ගණනක් පිළිගෙන ඇත්තේ ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයයි. ප්‍රජාතන්ත්‍රවාදය ඉතාම හොඳ පාලන ක්‍රමය ද? ප්‍රශ්නයකි. කාලානුරූපව එය අභියෝගයකට මුහුණ පා ඇති බව පෙනේ. එසේ සිදුවන්නේ මහජනතාව හා පාලකයන් අතර පවතින සම්මුතිය බිඳවැටීම සමගය. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය අවුරුදු හැටපහකට වැඩි කාලයක් අප රටේ පවත්වාගෙන ගියේය. එයින් මහජනතාවට යහපතක් සිදුව තිබේද? ඔවුන්ගේ ප්‍රශ්න නිරාකරණය කරගන්නට එයින් සැලසුන කාර්ය භාරය තෘප්තිමත් එකක්ද? ප්‍රජාතන්ත්‍රවාදයේ ශක්තිය විනිවිද භාවයක් තිබීමයි. රට තුළ ජීවත්වන සියලු ජන කොටස් එකමුතු කර ඔවුන් අතර විශ්වාසය හා ධෛර්යය වඩවන්නට මෙම ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය සමත් වීද? මෙම ප්‍රශ්න වලට ලැබෙන පිළිතුරු එකිනෙකට වෙනස් විය හැකිය.

පසුගිය දශක කිහිපය තුළ මෙරට ඇතිවූ ගැටුම්, ලේ හලන විප්ලව හා ත්‍රස්තවාදයට පදනම වූයේ අතෘප්තිය හා අසාධාරණය බව තේරුම්ගත යුතුය. මහජනතාව ඉල්ලා සිටින යුක්තිය හා සමානාත්මතාවය තහවුරු කරන්නට පාලකයෝ අසමත්විය. සමාජය වෙනුවෙන් පනවා ඇති නීති රීති හා ඒවා ආරක්ෂා කරන්නට මෙරට ඇති ආයතන ගණන විශාලය. නමුත් ක්‍රියාත්මකවීමේ දී දුබලතා එමටය. එයට සමාජයේ සියලුම දෙනා වගකිව යුතු ඉතා සංකීර්ණ එකකි.

ඇමරිකානු ජනාධිපති බැරක් ඔබාමා මහතා පසුගියදා බ්‍රිතාන්‍ය සංචාරයක නිතරවිය. බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව ඇමතූ එතුමා ප්‍රජාතන්ත්‍රවාදය මුහුණ දී ඇති අභියෝග පැහැදිළි කළේය. එහි දී එතුමා පළ කළ අදහස් වලින් ශ්‍රී ලංකාව පමණක් නොව ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය ඇති රටවල අභ්‍යන්තරය ගැන සියුම් අනාවරණයක් කරයි. නායකයන්ගේ භූමිකාව හා ප්‍රජාතන්ත්‍රවාදයේ අරමුණු වෙනස් වී ඇති අන්දම එම දේශනයේ දී විග්‍රහයක් කළේය. නායකයින්ගේ හඬ ඉහළ සිට පහලට ගමන් කරනු නොව පහළ මට්ටමේ සාමාන්‍ය මහජනතාවගේ අදහස් වලටත් වර්තමානයේ නායකයින් සවන් දිය යුතු බව කියා සිටියේය. සැබෑ ප්‍රජාතන්ත්‍රවාදය කුමක්ද? රටවල් පැවතිය හැකිය. ඒ රටවල් තුළ විවිධ ජාතීන්, විවිධ ආගම් හා විවිධ සංස්කෘතීන් ජීවත්වෙයි. එය රටක් නොව මවුබිමක් බවට පත්වන්නේ ජීවත්වන සියලු දෙනා එකට එකතු වී එක අරමුණකින් ක්‍රියාකරන අවස්ථාවේ දී බව ඔබාමා මහතාගේ දේශනයෙන් පළවූ තවත් වැදගත් අදහසකි. හැම රටකටම එකම විසඳුම නොගැලපෙන බව ද හෙතෙම පෙන්වා දුන්නේය. මේ අදහස් විශේෂ අවධානයට ලක්විය. එවැන්නක් පළ කරන්නට ලෝකයේ දියුණු ම හා බලවත්ම ප්‍රජාතන්ත්‍රවාදී රටේ නායකයාට සිදුවූයේ ඇයි? ඇමරිකාව එකපැත්තකින් තමන් ප්‍රජාතන්ත්‍රවාදී රටක් බව පෙන්වන අතර තවත් පැත්තකින් යුධ බලවතා බව ඔප්පු කර තිබේ. ලෝකය සාමකාමී හා පුද්ගල නිදහස ආරක්ෂා කර දෙන තැනක් බවට පත් කරන්නට ක්‍රියා කරයි. සීතල යුද්ධයට පසු බිඳ වැටුණ ලෝකයේ බල අරගලය වෙනුවට අද ඇත්තේ එක බලවේගයකි. එය ඇමරිකානු ශක්තිය බව පැහැදිළිව පෙනෙන්නට තිබේ. ප්‍රජාතන්ත්‍රවාදය හා එහි භූමිකාව ගැන දක්වන අදහස විග්‍රහ කළ යුතු වැදගත් කරුණකි.

ප්‍රජාතන්ත්‍රවාදී පාලනය ගැන රටට ඇති දීර්ඝ කාලීන අත්දැකීම් යළි සමාලෝචනය කළ යුතුව තිබේ. රාමුව එකම වුවත් රටින් රට ඇති සුවිශේෂීතා අනුව ප්‍රජාතන්ත්‍රවාදි රාමුව ජන සම්මුතිය සමග ගලපා ගත යුතුය. ප්‍රජාතන්ත්‍රවාදයේ ශක්තිය හා දුර්වලතා ගැන ජනතාවට අදහසක් ඇත. ශ්‍රී ලංකාවේ දකුණ පමණක් නොව උතුර ද යුක්තිය හා සාධාරණත්වය ඉල්ලා සිටියේය. රජයේ පාලනයට විරුද්ධව කැරළි ගැසීය. එයින් පෙනෙන්නේ ප්‍රශ්නයක් ඇති බවය. රට තුළ ක්‍රියාත්මක පාලනය සකස් වී ඇත්තේ බටහිර විසින් සකස් කරන ලද ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යවස්ථා රාමුව අනුවය. එහි මූලික ලක්ෂණය බලය එක තැනෙකට එකතුවීම වැලැක්වීමයි. එකිනෙක මත ක්‍රියාකරන ආයතන මගින් බලය සීමා කරන ව්‍යුහයක් බටහිර රාමුව අනුව සකස්කළ ප්‍රජාතන්ත්‍රවාදයට ඇතුලත්ය. ව්‍යවස්ථාදායකය හා අධිකරණය වැනි ආයතන එකිනෙක මත යුක්ති සහගත අන්දමින් පාලනයවීම නිසා මහජනතාවට සාධාරණය ඉටුවෙයි.

පවතින ව්‍යවස්ථාව හා දේශපාලන සංස්කෘතිය රටවැසියන් සියලු දෙනා ශ්‍රී ලාංකිකයන් ලෙස එකමුතු කරන්නට සමත්ව නැත. එය මූලික සංකල්පයට පටහැනි එකකි. බෙදුන සමාජය පක්ෂ වශයෙන් තවදුරටත් සාහසික ලෙස බෙදන්නට අද පවතින ක්‍රමය හවුල් වී ඇත. මහජනතාවගේ අයිතිවාසිකම් හා නිදහස සමානව ආරක්ෂා වී නැත. කාලාන්තරයක් පැවති මේ තත්ත්වය නිසා සිංහල, දෙමළ හා මුස්ලිම් අන්තවාද බිහිවිය. දැඩි ආගමික මතධාරීන් බිහිවී තිබේ. පුද්ගලයාගේ දක්ෂතාවය හෝ හැකියාවට සාධාරණ අවස්ථා හිමි නොවන බව පැහැදිලි සමාජයක ප්‍රජාතන්ත්‍රවාදයේ උතුම් ගුණාංග ආරක්ෂා වී ඇතැයි පැහැදිළි කිරීම අපහසුය.

මෙවැනි වාතාවරණයක් ඇති වූයේ ඇයි? එය බටහිරට යටත් වීමේ ප්‍රතිඵලයකි. යටත් වු ජාතියක් වශයෙන් ගත කළ අවුරුදු පන්සියය තුළ ශ්‍රී ලංකාවේ අනන්‍යතාවය විකෘති විය. බටහිර පාලකයන් ජාති, කුල, ආගම් හා පංති පසුබිම අනුව ශ්‍රි ලංකාව බෙදන්නට උපක්‍රම යෙදීය. එයින් සමාජය එකමුතු වීම වැළැක්වීය. විදේශික සුළු කණ්ඩායමකට මෙරට පාලනය කළ හැකි වූයේ පංති පරතරය පවත්වාගෙන යමින් අවස්ථාවාදී අන්දමට මෙරටින් මතු කරගත් රදල කණ්ඩායමක් ස්වකීය පාලනයට සම්බන්ධ කර ගැනීම නිසාය. රට නිදහස් වූ නමුත් රටේ පැවති රදල ලක්ෂණ සහ බෙදීම් අවසන් වූයේ නැත. එය තව තවත් තහවුරු විය. ජාතිය, කුලය හා අධ්‍යාපනය ලැබූ පාසල අනුව අවස්ථාව හිමිවන්නට අවශ්‍ය සාධක බව සමාජ ස්ථරයට යටින් පෙණුන සත්‍යයයි. එළිපිට පිළිනොගැනුනත් ඕනෑම වැදගත් අවස්ථාවක දී තීරණ ගැණුනේ මෙම කල්ලි අනුවය. පසුව එය දේශපාලන පක්ෂ දක්වා ව්‍යාප්ත විය. කඩුව පාවිච්චි කරන ආකාරය අනුව ජනතාවට කෙනහිළිකම් ඇතිවිය. ජන කණ්ඩායම් අතර පන්ති වෛරය හට ගත්තේය. තමන්ට සිදුවන අසාධාරණය බරපතල වන බව පෙනෙන විට කකියන රුධිරය ඇති තරුණන්ට ඉතිරිවූයේ එයට එරෙහිව විප්ලවයකට යාම පමණකි.

Melting Pot and Salad Bowl සංකල්පය අද ජාත්‍යන්තර ප්‍රජාවගේ අවධානයට ලක්ව ඇති තවත් ප්‍රධාන මාතෘකාවකි. සියලු අසමානතා ඉවත් කරන පදනම වශයෙන් ගැනෙයි. රටක අනන්‍යතාවය ඒකඑසබට ඡදව් එකක් එනම් පළතුරු අඹරා අලුතින් හදන මිශ්‍රණයක් විය හැකිය. මෙම මිශ්‍රණයේ පළතුරු කැබලි එකිනෙක වෙන්කර හඳුනා ගත නොහැකිය. ජාතිය, ආගම, භාෂාව, සංස්කෘතිය අනුව ඇති අනන්‍යතා සියල්ල එකට කලතා අලුත් රටක් හදන්නට පුළුවන. ලෝක ඉතිහාසයේ පරිවර්තන වලින් එවැනි සංස්කෘති බිහිකර තිබේ. ප්‍රංශය එයට උදාහරණයකි. එසේ නැති නම් විකල්පය Salad Bowl ක්‍රමයයි. සලාදයක පළතුරු වර්ග වෙන්වෙන්ව දැක ගත හැකිය. රසය, වර්ණය වෙනම ඇතත් එය ඇත්තේ එකම භාජනයකය. ඒ අනුව එක රටක් තුළ ජීවත්වන වැසියන්ගේ විවිධ ආගම්, විවිධ සංස්කෘතීන් හා විවිධ ඇදහිලි වලට වෙන වෙනම ගරු කරයි. මෙම ආදර්ශය ගැන රටක අනන්‍යතාව ඇති කිරීමේ දී අද ජාත්‍යන්තර ප්‍රජාව බහුලව අවධානය කරයි. අවශ්‍ය එකට ජීවත්වන විවිධ අනන්‍යතා ඇති රටක්ද? නැතිනම් සියලු අනන්‍යතා අමතක කර ඒ වෙනුවට අලුතින් හඳුන්වා දෙන මිශ්‍ර වූ සංස්කෘතික අනන්‍යතාවයක් ද යන සංවාදය පවතී.

යුධ පරිසරයෙන් මිදී සාමකාමී යුගයට ඇතුළුවෙමින් සිටින ශ්‍රී ලංකාවට අද අනන්‍යතා ප්‍රශ්නයක් තිබේ. අතීත උරුමයන් සහමුලින්ම අමතක කර අලුත් රටක් ගොඩනැගීම යන සංකල්පය අපට නොගැලපේ. එකිනෙකට වෙනස් අනන්‍යතාව සහිතව සියලුම ජන කොටස් වලට ගෞරවයෙන් හා

අභිමානයෙන් ජීවත්විය යුතු පරිසරයක් ඇති කළ යුතුය. එය කළ හැකි වන්නේ ව්‍යවස්ථාවෙන් තහවුරු කිරීමෙන් පමණක් නොවේ. මහජනතාවට යුක්තිය හා සාධාරණත්වය දැනෙන්නට පටන් ගත යුතුය. සාමාන්‍ය ජනතාවට එය දැනෙන්නට පටන්ගන්නේ පාලනයේ දී ගන්නා තීන්දු අනුවය. ජාතිය, කුලය හා පංති පරතරය අනුව අසාධාරණයක් සිදුනොවෙන අතර රට තුළ ප්‍රායෝගිකව සමාන අවස්ථා පවතින බව තහවුරු විය යුතුය. යුධ ගැටුම්වලින් පසු නැගෙන සමාජය තුළ එවැනි පදනමක් බිහිකරන්නට අප සමත්ව තිබේද? ජනතාව තුළ සම්මුතියක් ඇතිව තිබේද? සාමාන්‍යයෙන් මහජනතාව ස්වකීය නායකයින් සමග නිහඬ සම්මුතියක සිටී. මේ සම්මුතිය අනුව තම සාධාරණ අපේක්ෂා ඉටුකරනු ඇතැයි මහජනතාව අපේක්ෂා කරති. තමන්ගේ ප්‍රශ්න වලට යුක්ති සහගත විසඳුම් බලාපොරොත්තු වෙති. තම දරුවන්ගේ අනාගතය සාක්ෂාත් වනු ඇතැයි බලා සිටිති. මහජන සම්මුතියට ගරු කරන ජනසම්මතවාදී නායකයෝ බැබලෙති. සම්මුතිය හා ප්‍රජාතන්ත්‍රවාදය නොසලකා ක්‍රියා කරන, බලය ආරක්ෂා කරගැනීමට වෙහෙසෙන නායකයෝ එක්තරා මොහොතක මහජනතාව විසින්ම බලයෙන් පහ කරති. ශ්‍රී ලංකාව අද සම්මුතිය සොයා යා යුතු අවස්ථාවක සිටී. ත්‍රස්තවාදය පරාජය කර අවුරුදු දෙකක් ගත වන විට මහජන සම්මුතිය සොයා යා යුතු මොහොත තව තවත් ඈතට යන විට ප්‍රජාතන්ත්‍රවාදය, එහි ගුණාංග අර්බුදයට පත්වෙයි. බටහිර ප්‍රජාව තමන්ට එය ගැටලුකාරී බව එළිපිට ප්‍රකාශකරන මේ වකවානුවේ එහි අවාසනාවන්ත තත්ත්වයට ගොදුරු වූ අපට යළිත් එම ව්‍යසනය වෙතම නොදැනුවත්වම ඇදී යමින් සිටී.

යුද්ධයෙන් පසු ජයග්‍රහණයෙන් උදම් වීම වෙනුවට මහජනතාව සමග සම්මුතියකට යාම අද අවශ්‍ය කරුණකි. යුධ පරිසරය තුළ රටේ සංස්කෘතිය දෙදරුමට ලක්විය. ජාතීන් අතර ප්‍රශ්න බරපතල අන්දමට වර්ධනය විය. භාෂාව වෙනස්කම් වලට ගොදුරුවිය. දැන් එකී අතීතය අවසන්කළ යුතුය. අලුත් සමාජයක් ගොඩ නැගිය යුතුය. පළතුරු යුෂ අන්දමට සියලු සංස්කෘති කළතා සකස් කරන Melting Pot සමාජයක් නොව Salad Bowl ක්‍රමයකට රට තුළ ඉඩ ඇති බවත්, බහුතරය විසින් සුළුතරයේ අයිතිවාසිකම් ගෞරවයෙන් ආරක්ෂා කරන සමාජයක් ගොඩනගන බවත් ඔප්පු කළ යුතුය. බහුතරය හා සුළුතරය යන බෙදීම් තව දුරටත් නැති බව තහවුරු කළ යුතුය. එවිට අන්‍යයන්ට ගරු කරන එකිනෙකා කෙරෙහි සැලකිලිමත්වන සමාජයක් ගොඩ නැගේ.

කෙන්යාවෙන් පැමිණි පරම්පරාවක සාමාජිතයෙකු වූ බැරක් ඔබාමා ඇමරිකාවේ බලයට පත්වීය. හංගේරියානු සම්භවයක් සහිත නිකොලස් සකෝසි ප්‍රංශ ජනාධිපති ධුරයට පත්විය. ඉන්දියාවේ අගමැති සුළු ජන කොටසක් වන සික් ජාතික මන්මෝහන් සිං ය. සිංගප්පූරුව සුළු ජාතිකයන්ගේ විශ්වාසය දිනා ඇත්තේ ජාතික ගීය මැලේ භාෂාවෙන් ගායනා කරමින්ය. එරට හමුදාවට අණ දෙන්නේත් මැලේ භාෂාවෙනි. ලෝකයේ නොයෙක් රටවල බහුතර ය නියෝජනය කරන ආගම, භාෂාව වෙනුවට සුළු ජනතාවගේ ආගම්, භාෂා හා සිරිත් විරිත්වලට තැනක් දී තිබේ. එයින් රට තුළ විවිධත්වය තුළින් අනන්‍යතාව මතු කර ගන්නට සමත්ව විය. ජාතික එකමුතුව ඇති කර ගත හැකිවී ඇත. එහි ඇත්තේ සමාන අවස්ථාව පිළිබඳ පණිවුඩයයි. තමන්ගේ ගමන් මග අවුරා ඇති බව දැනෙන විට අතෘප්තිය ඇතිවෙයි. බලහත්කාරයක් ඇති බව දැනෙන්ට පටන් ගනී. මේවා අපට වැදගත් පාඩම්ය.

නායකත්වය යනු යුගයට අනුව පරිවර්තනය හඳුනාගෙන රට පාලනය කිරීමයි. වසර කිහිපයකට කලින් පැවති තත්තවයට වඩා අද පරිසරය වෙනස්ය. අභියෝග විවිධය. ශ්‍රී ලංකාව තව දුරටත් දූපතක් නොවේ. එය වේගයෙන් ගෝලීයකරණ සමාජයට ඇතුල් වෙමින් තිබේ. තොරතුරු තාක්ෂණය එයට දායක වී ඇත. මෙම ගෝලීය සමාජය තුළ ලාංකිකත්වය වෙනස් එකකි. එහි ඇතුලාන්තයේ සියලු ජන කොටස් වලට අභිමානය, ගෞරවය සමග සමාන අවස්ථාව ද තිබිය යුතුය. එය ඇති කළ හැක්කේ ප්‍රජාතන්ත්‍රවාදය යනු තව දුරටත් බහුතරය දකින මතය නොවන බව තේරුම් ගැනීමෙන් පමණකි. මෙම නව බලවේගය තුළ අදහස් පැන නැගෙන්නේ විවිධ අන්දමටය. සමාජ කණ්ඩායමකට වඩා එක පුද්ගලයෙකුට සිය මතය වේගයෙන් පතුරවන්නට හැකියාව ඇත. මෙම ස්වභාවය ඉවසිල්ලෙන් අධ්‍යයනය කිරීම වැදගත්ය. වෙනස්කම් අගය කර අනන්‍යතාවලට ගරු කරන අලුත් සමාජ සම්මුතියකට ඇතුළු විය යුතුය.

ජාත්‍යන්තර ප්‍රජාව එවැනි අලුත් තත්ත්වයන්ට ගොදුරු වූ තමන්ගේ සමාජ වලට සාධාරණත්වය ඇති කිරීම ගැන අවධානය යොමු කරමින් සිටී. ඉතිහාසයේ දැවැන්ත අවාසනාවන්ත ඉරණමකට ගොදුරු වූ ශ්‍රී ලංකාවේ අලුත් යුගය නිර්මාණය කිරීම ඉදිරියේ වර්තමාන සමාජ දේශපාලන නායකත්වයට උරුම වී ඇති අභියෝගය පුළුල් එකකි.